

# 11 වසර චිත්‍ර කලාව

**කේ.ඩබ්.චන්දන කුමාරසිංහ,**
**කෑ/වර/ධර්මසිරි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය,**
**තුල්හිරිය.**

- නිපුනතාවය:3.0

  -පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.

- නිපුනතා මට්ටම;-

  නිර්මාණාත්මක සැරසිළි ඒකක භාවිතා කර භාණ්ඩ සඳහා සැරසිළි නිර්මාණය කරයි.

- ක්‍රියාකාරකම;3.3.1

  “සාරි පල්ලුවක් අඳිමු“(ස්ක්‍රීන් මුද්‍රණය යටතේ සුදු සහ කළු යන වර්ණ භාවතා කරමින් සාරි පල්ලුවක් නිර්මාණය කිරීම.)

## සාරිය යනු-

සංස්කෘත බසින් “සට්ටිකා“ තේරුමයි.යන වචනය කාන්තාවන්ගේ ඇඳුම යන්නයි.

පාරිභාරික භාණ්ඩ යනු-

මිනිසා විසින් එදිනෙදා පරිහරණය කරන දේවල්

# නිර්මාණයේ අරමුණ ගැනද අප පලමුව සිතිය යුතුය.

1.පාරිභෝගිකයාගේ රුචිකත්වය. (වර්ණය)

2.පාරිභෝගිකයාට අවශ්‍ය ඇඳුම. උදා:-

සාරියක්, ඔසරිය, සරම, කමිසයක්

3. පාරිභෝගිකයාගේ රූපය. (පෙනුම / සමෙහි පැහැය / සිරුරේ හැඩය)

4. පාරිභෝගිකයාගේ වයස.

5. අවස්ථාව.උදා:- උදෑසන, දහවල්, රාත්‍රී උත්සව අවස්ථාවක්ද, මංගල උත්සවයක්

අවමංගල්‍ය උත්සවයක්.

6. පාරිභෝගිකයා කවරෙක් ද යන බව,

උදා:- ගුරුවරයෙක් / උත්සවයක ආරාධිත අමුත්තෙක් ද

7. ඇඳුමෙහි වටිනාකම.

8. සමාජ මට්ටම.

- සාරි පල්ලුවක විශේෂත්වය-

  1.ආයත චතුරස්‍රාකාර හැඩයකි.

  2.ඔසරිය ඇඳීමේදි පල්ලුව කොටස ඉදිරිපසට පිළඹිමු වේ.

# ➢ මෝස්තරයක් නිර්මාණයේදී සැලකිය යුතු කරුණු

1.තේමාවට උචිත බව/මුළුතල/ව්‍යාප්ත/මුද්‍රණය සදහාද යන්න.

2.නිර්මාණාත්මක හැඩ හෝ ස්වාභාවික හැඩ ආශ්‍රය කර ගැනීම.

3.අවශ්‍යතාවය අනුව සැළසුම් කිරීමේදී ජ්‍යාමිතික උපකරණ භාවිතය.

4.තේමාවටඋචිත වන අයුරින් සැරසිළි ඒකකයක් නිර්මාණය කිරීම.

5.තේමාවට උචිත වන අයුරින් වර්ණ යෙදීම.

6.ක්‍රමාණුකුල බව,පිරිසිදු බව,ඇකෙන අයුරින් වර්ණ කිරීම.

7.මෝස්තර ඒකකය නිවැරදි අයුරින් භාවිතා කිරීම.

# මුළුතල මෝස්තරයක් යනු

-නිශ්චිත සීමාවක ඇද නිම කරන මෝස්තර වේ.

# මුළුතල මෝස්තරය නිර්මාණය කරන අවස්ථා කිහිපයක්-

පාපිස්ස,මේස රෙදි,සාරි පල්ලු,කුෂන් කවර,චතුරස්‍රාකාර පිත්තල බන්දේසි,මේස, දොරවල්,පිගන් ගඩොල්

පාරිභාරික භාණ්ඩ යනු-මිනිසා විසින් එදිනෙදා පරිහරණය කරන දේවල්

මෝස්තර ඒකකයක් නිර්මාණය කිරීමේදී අවස්ථා 4ක් දැක්විය හැකිය.එනම්

1.ස්වාභාවික හැඩය ඒ අයුරින්ම යොදා ගෙන මෝස්තර ඒකකය නිර්මානය කිරීම.

2.ස්වාභාවික හැඩයෙන් කොටසක්ඉවත් කර මෝස්තර ඒකකය නිර්මානය කිරීම.

3.ඉවත් කළ හැඩයට නව හැඩතලයක් එකතු කර මෝස්තර ඒකකය නිර්මාණය කිරීම.

4.මූලික හැඩය තබා ගනිමින් එය නිර්මාණාත්මකව වෙනස් කර මෝස්තර ඒකකය නිර්මාණය කිරීම.

# මෝස්තර නිර්මාණයේදී විශේෂයෙන් සැළකිය යුතු කරුණු

1.නිර්මාණාත්මක බව
2.නව්‍යතාවය,අපූර්වත්වය

# සාරි පල්ලු













මෝස්තර ඒකකය නිර්මාණය සදහා ස්වාභාවික
මඤ්ඤොක්කා කොළයක් මූලික කර ගැනීම.




**දළ සටහන් නිර්මාණය**:-දළ සටහන් ඇඳ ඉන් පසුව මෝස්තර ඒකක කිහිපයක් ඇදීම ඉතා වැදගත්,ඉන් හොදම ඒකකය මෝස්තරය සදහා යොදා ගැනීම තම නිර්මාණය සාර්ථක වීමට හේතුවක් වේ.











- ට්‍රේසින් කඩදාසිය භාවිතා කරමින් ඇද ගත් මෝස්තර ඒකක කොටස් පිටපත් කර ගැනීම.





කුඩා මෝස්තර ඒකක කිහිපයක් භාවිතා කරමින් ප්‍රධාන මෝස්තර ඒකකය නිර්මාණය කරගත හැක.

- කළු,සුදු යන වර්ණ භාවිතා කරමින් කරනු ලබන ඇඳුම් නිර්මාණ සඳහා වර්තමාණ වෙළඳපොළ තුළ විශාල ඉල්ලුමක් පවතී.එමෙන්ම ස්ක්‍රීන් මුද්‍රණය සහ බතික් ක්‍රමයන් ඒ සඳහා යොදා ගැනේ.
- මෙම සාරි පල්ලුවද ස්ක්‍රීන් ක්‍රමය යටතේ නිර්මානය වන නිසා වර්ණ දෙකක් භාවිතා කර ඇත.





- කළු සහ සුදු වර්ණ භාවිතා කරමින් පල්ලුව වර්ණ ගැන්වේ,පසුව ස්ක්‍රීන් මුද්‍රණය ක්‍රමය භාවිතා කරමින් සාරි පල්ලුව නිර්මාණය කරනු ලැබේ.පැතලි වර්ණ යොදා ගැනීමත්,මුද්‍රණය සඳහා පහසු වීමත්,ඉන් බලා පොරොත්තු වේ.



- ස්ක්‍රීන් මුද්‍රණයේදි සීමිත වර්ණ මාලාවක් භාවිතා කිරීම යෝග්‍ය වේ.




- ආයත චතුරස්‍රාකාර හැඩයක් බැවින් මුළුතල මෝස්තරයක් ලෙස යොදා ගෙන ඇත.
- මෙහි උස සාමාන්‍යයෙන් 36(අඟල්) වන අතර,පල්ලුවේ පළල මෝස්තරය අනුව වෙනස් වේ.



- ස්වාභාවික පරිසරයේ ශාකයක කොටසක් භාවිතා කර එය සරළ නිර්මාණාත්මක හැඩයක් බවට පත් කරමින් ස්ක්‍රීන් ක්‍රමය යටතේ මුද්‍රණය කිරීමට හැකි සාරි පල්ලුවක් මේ ආකාරයට නිර්මාණය කර ගත හැක.



# අවසන් කළ සාරි පල්ලුව



පල්ලුවට ගැළපෙන අයුරින් සාරි බෝඩරයද මේ අයුරින් නිර්මාණය කරගත හැක.පල්ලුවට භාවිතා කළ ආකාරයටම කුඩා මෝස්තර ඒකකයක් එම ශාක කොටසින්ම නිර්මාණාත්මකව වෙනස් කර බෝඩරයට භාවිතා කළ හැක.



පැවරුම:-ස්වාභාවික ශාකමය හැඩ නිර්මාණාත්මකව භාවිතා කරමින් “සාරි පල්ලුවක්” නිර්මාණය කරන්න.

ස්තූතියි!

කේ.ඩබ්.චන්දන කුමාරසිංහ,
කෑ/වර/ධර්මසිරි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය,
තුල්හිරිය.